මුදල් හා බැංකු කටයුතු සංවර්ධනය

මුදල් සැපයුම

1976 වර්ෂය අවසානයෙහි පැවති මුදල් සැපයුම 15 වැනි සංඛ්‍යා සටහනෙහි දැක්වෙන පරිදි 1975 අවසානයෙහි පැවති මට්ටමට වඩා රුපියල් 107 කෝටි 70 ලක්ෂයක වැඩිවීමක් පෙන්නුම් කළේය. 1975 වර්ෂයේදී වූ සියයට 4·8 ක හා 1974 වර්ෂයේදී වූ සියයට 6·0 ක වැඩිවීම් හා සසඳන කල මෙය සියයට 34·9 ක වැඩිවීමකි. මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍යය (වර්ෂය මුළුල්ලේම මුදල් සැපයුමෙහි වූ වෙනස්වීම්වල ස්වභාවයන් අන්තර් ගත වූ දර්ශකයක් ලෙස සැලකිය හැකිය;) 1976 වර්ෂය තුළ දී සියයට 22·4 කින් වැඩිවිය. 1975 සහ 1974 වර්ෂ වලදී එහි වැඩිවීම පිළිවෙළින් සියයට 1·9 ක් සහ සියයට 18 1 ක් විය.

මුදල් සැපයුමෙහි සාමාන්‍යයෙන් දක්නට ලැබෙන කාලීන අඩු වැඩිවීම් 1976 වර්ෂය තුළදී දකින්නට නොලැබුනාක් මෙන්ම, ජූලි මාසය හැරුනවිට සෙසු සෑම මාසයකදීම මුදල් සැපයුම නොකඩවා ඉහළ නැගීමක් පෙන්නුම් කළේය. රජයේ හිඟ මුදල් සම්පාදනය සහ විදේශීය බැංකු වත්කම්හි වූ වැඩිවීම, මුදල් සැපයුමේ කාලීන වෙනස්කම් පැහැදිලි ලෙස පෙන්නුම් නොකිරීමට තරම් විශාල විය. කාලීන වෙනස්කම් ඇති කරවන ඇතැම් සාධකයන් වර්ෂය තුළදී කිසිසේත්ම දක්නට නොලැබුණි. නිදසුනක් ලෙස, සාමාන්‍යයෙන් කාලීන වෙනස්කමක් පෙන්නුම් කරන, සහතික මිල ක්‍රමය යටතේ වූ අත්තිකාරම් 1976 ජූලි මාසයේ දී රුපියල් 37 කෝටි 10 ලක්ෂයකින් වැඩි වුවද, වසරෙහි සෙසු කාලපරිච්ඡේදය තුළදී එය නොකඩවාම ඉහළ මට්ටමක පැවතුනි.

1976 වර්ෂය තුළ දී මුදල් සැපයුමෙහි මාසික සාමාන්‍යයන්, ඉකුත් වසරේ අනුරූප මාස හා සසඳනවිට ජනවාරි මාසයේ වූ සියයට 6·4 ක අනුපාතිකය හා දෙසැම්බර් මාසයේ වූ සියයට 34·9 ක අනුපාතිකය අතරතුර නොකඩවාම වාගේ ඉහළ යමින් පැවතුණි. එහෙත්, 1975 වර්ෂයේදී වූ මෙවැනි විශාලතම වැඩිවීම සියයට 6 1 ක් පමණක් විය.

වර්ෂය තුළදී මුදල් සැපයුමෙහි වැඩිවීමට මූලික මිශයෙන් බලපෑ සාධක වූයේ, රාජ්‍ය අංශයෙහි මූල්‍ය කටයුතු සහ ශුද්ධ විදේශීය බැංකු වත්කම්හි වූ වැඩිවීම්ය. බැංකු ක්‍රමය සමග වූ රජයේ මූල්‍ය කටයුතු, මුදල් සැපයුම කෙරෙහි රුපියල් 54 කෝටියක ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කිරීමට හේතුවිය. ආදයම් තත්වය සෙමින් වැඩෙන අවස්ථාවකදී ඉහළ මට්ටමක ප්‍රාග්ධන සහ වර්තන වියදම් සමූහයක්, ශුභසාධක සහනාධාරද ඇතුලුව, පවත්වාගෙන යෑම සඳහා, බැංකු ණය කරා ඇදී යාමට රජයට සිදුවීය. රජයට නිකුත් කළ ණය දැඩිසේ ඉහළ ගියද, බැංකු ක්‍රමය වෙත වූ රජයේ තැන්පතු වැඩිවීම නිසා එය තරමක් දුරට සමහන් විය. 1976 වර්ෂය තුළ දී වෙළෙඳ බැංකු විසින් රජයට දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 36 කෝටි 60 ලක්ෂයකින් වැඩිවිය. වෙළෙඳ බැංකු වෙතැති භාණ්ඩාගාර බිල්පත්, රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් සහ රජයේ ආනයන බිල්පත් රුපියල් 31 කෝටි 50 ලක්ෂයකින් වැඩි වූ අතර, රජයේ ගිණුම් මත කළ මිලට ගැනීම් රුපියල් 5 කෝටි 10 ලක්ෂයකින් වැඩිවිය. මේ හැරුණවිට මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත් රුපියල් 3 කෝටි 52 ලක්ෂයකින් වැඩිවීමත්, රජයට දුන් මහ බැංකු තාවකාලික අත්තිකාරම් රුපියල් 1 කෝටි 10 ලක්ෂයකින් වැඩිවීමත් හේතුකොටගෙන රජය විසින් මහ බැංකුවෙන් ලබාගත් ණය ද රුපියල් 36 කෝටි 30 ලක්ෂයකින් ඉහළ නැගුණි. එමෙන්ම, මහ බැංකුවේ අනෙකුත් වගකීම් හා ගිණුම්වල ශුද්ධ වෙනස් වීම්ද, රුපියල් 8 කෝටි 30 ලක්ෂයකින් යුතු ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කිරීමට හේතුවිය. රජයේ මූල්‍ය කටයුතු නිසා ඇති වූ මෙම ප්‍රසාරණාත්මක බලපෑම සමහන් කිරීමට ඇතිවුනු එකම සාධකය වූයේ රුපියල් 27 කෝටි 30 ලක්ෂයකින් වැඩිවූ වෙළෙඳ බැංකු වෙතවූ රජයේ තැන්පතුය මෙය, 1975 වර්ෂය තුළදී බැංකු ක්‍රමය වෙතවූ රජයේ තැන්පතු සහ භාණ්ඩාගාරයේ වූ මුදල් ශේෂවල වූ වෙනස්වීම් මගින් මුදල් සැපයුම කෙරෙහි ඇතිකළ රුපියල් 12 කෝටියක ප්‍රසාරණාත්මක බලපෑමට වඩා ඉමහත්සේ වෙනස් තත්වයකි.

15 වැනි සංඛ්‍යා සටහන

දෙසැම්බර් 1975 / දෙසැම්බර් 1976 තුළ මුදල් සැපයුමේ වෙනස්වීම් සහ ඊට බලපෑ සාධක

රුපි. දශලක්ෂ

සංයුතිය		
(අ) මහජනයා සතු ඉල්ලුම් තැන්පතුවල වෙනස්වීම්	+ 606·7	
(ආ) මහජනයා වෙතැති ව්‍යවහාර මුදල්වල වෙනස් වීම	+ 470·7	
මුදල් සැපයුමේ ශුද්ධ වෙනස		+ 1,077·4
විශ්ලේෂණය		
1. බැංකු විදේශීය වත්කම් (ශුද්ධ)		+ 470·1
2. පෞද්ගලික අංශය		– 14·2
(අ) සමුපකාර ආයතනයන්ට දෙනලද වෙළෙඳ බැංකු ණය ..	+ 112·8	
(ආ) පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනුකරුවන්ට දෙනලද වෙළෙඳ බැංකු ණය	+ 426·7	
(ඇ) සමුපකාර ආයතනවල කාලීන හා ඉතුරුම් තැන්පතු ..	– 21·4	
(ඈ) පෞද්ගලික අංශයේ අනෙකුත් ගනුදෙනුකරුවන්ගේ කාලීන හා ඉතුරුම් තැන්පතු	– 486·6	
(ඉ) වෙළෙඳ බැංකුවල අනෙකුත් වගකීම් හා ගිණුම් (ශුද්ධ) ..	– 45·7	
3. අර්ධ රාජ්‍ය අංශය		+ 84·1
(අ) රාජ්‍ය සංස්ථාවන්ට දෙනලද වෙළෙඳ බැංකු ණය ..	+ 42·6	
(ආ) රාජ්‍ය සංස්ථාවල කාලීන හා ඉතුරුම් තැන්පතු ..	+ 41·5	
4. රාජ්‍ය අංශය		+ 540·5
(අ) වෙළෙඳ බැංකු සතු භාණ්ඩාගාර බිල්පත්, රජයේ සහ රජය සහතික කළ සුරැකුම්පත් සහ රජයේ ආනයන බිල්පත් ..	+ 315·4	
(ආ) රජයේ ගිණුම් මත මිලදී ගත් මුදල් ශීර්ෂ	+ 51·4	
(ඇ) මහ බැංකුවේ භාණ්ඩාගාර බිල්පත් සහ රජයේ හා රජය සහතික කළ සුරැකුම්පත්	+ 351·7	
(ඈ) මහ බැංකුවේ අත්තිකාරම්	+ 11·5	
(ඉ) මහ බැංකුවේ අනෙකුත් වගකීම් සහ ගිණුම් (ශුද්ධ) ..	+ 83·2	
(ඊ) බැංකු ක්‍රමය වෙතැති රජයේ තැන්පතු සහ මහ භාණ්ඩාගාරය හා කච්චේරි වෙතැති මුදල් ශේෂ	– 272·6	
5. හුවමාරු වෙමින් පවත්නා ශීර්ෂයන් සඳහා ගැළපිලි		– 3·1
ශුද්ධ වෙනස		+ 1,077·4

සටහන: සලකුණුවලින් මුදල් සැපයුම කෙරෙහි වූ බලපෑම දැක්වේ.

රජයට බැංකු ක්‍රමයෙහි සහාය සෙවීමේ අවශ්‍යතාවය ඇතිවූයේ, 1976 අයවැය ක්‍රියාවලියේ අවසන් ප්‍රතිඵල අයවැය ඇස්තමේන්තුවලට වඩා සැලකිය යුතු ප්‍රමාණයකින් වෙනස්වීම නිසාය. මූලික ඇස්තමේන්තු වලට අනුව, 1976 අයවැයෙහි වූ රුපියල් 229 කෝටි 60 ලක්ෂයක අයවැය පරතරය සම්පූර්ණ වශයෙන්ම ප්‍රසාරණාත්මක නොවන මූලයන් මගින් පියවීමට අපේක්ෂා කරන ලදී. එසේ වුවද, වසර ගතවත්ම නියත ලැබීම් හා වියදම්වල මූලික ඇස්තමේන්තුවලට වඩා සැලකිය යුතු ප්‍රමාණයක වෙනස් වීමක් දක්නට ලැබුණි. 1976 දී, අවසන් අයවැය තත්වය යටතේ මුළු වියදම් රුපියල් 137 කෝටි 30 ලක්ෂයකින් වැඩි වුවද, එය හිලව් කිරිම සඳහා ආදායමෙහි වූයේ රුපියල් 9 කෝටි 40 ලක්ෂයක වැඩිවීමක් පමණි. මේ අනුව, වර්ෂයෙහි අයවැය හිඟය රුපියල් 357 කෝටි 60 ලක්ෂය දක්වා වැඩිවූ අතර, එය ප්‍රසාරණාත්මක නොවන දේශීය මූලයන්ගෙන් පියවීමට ඇති හැකියාව බෙහෙවින්ම ඉක්මවූ බැවින්, ප්‍රසාරණාත්මක ක්‍රමවලින් මුදල් සැපයීමේ අවශ්‍යතාවය ඇතිවිය.

විමර්ශනයට ලක් කෙරෙන වර්ෂය තුළදී මූල්‍ය ප්‍රසාරණයට රුකුල් දුන් දෙවන වැදගත් සාධකය වූයේ විදේශීය බැංකු වත්කම්හි වූ වර්ධනයයි. 1974 හා 1975 යන වර්ෂවලදී පිළිවෙළින් රුපියල් 17 කෝටි 90 ලක්ෂයක හා රුපියල් 21 කෝටි 40 ලක්ෂයක සැලකිය යුතු අඩුවීමකින් පසු, 1976 වර්ෂය තුළදී විදේශීය බැංකු වත්කම් රුපියල් 47 කෝටියකින් වැඩි විය. විදේශීය වත්කම්වල වූ මෙම වැඩිවීම විශාල වශයෙන් මහ බැංකුවේ විදේශීය වත්කම්වල රුපියල් 30 කෝටි 50 ලක්ෂයක වැඩිවීමක් මගින් පිළිබිඹු වූ අතර, එය මූලික වශයෙන් බැංකුව විදේශයන් හි පවත්වා ගත් ද්‍රවශීල ශේෂයන් ලෙස තිබිණි. එමෙන්ම, ඉකුත් වසරෙහි රුපියල් 70 ලක්ෂයක අඩුවීමක් සිදුවූ වෙළෙඳ බැංකු ශුද්ධ විදේශීය වත්කම් වල 1976 වර්ෂය තුළදී රුපියල් 16 කෝටි 50 ලක්ෂයක වැඩිවීමක් හටගති. මහ බැංකුවේ ශුද්ධ විදේශීය වත්කම්වල වූ වැඩිවීම, විදේශයන් හි වූ මුදල් හා ශේෂයන්, විදේශ රාජ්‍ය–යන්හි සුරැකුම්පත් සහ විශේෂ හැරගැනුම් අයිතිවාසිකම් හි ප්‍රතිඵලයක් වූ අතර, එම වත්කම් වල වූ වැඩිවීම ජාත්‍යන්තර සංවිධාන වෙත වූ තැන්පතු සහ විදේශ වලින් ගත් ණය මගින් තරමක් දුරට කපා හරිනු ලැබී ය. සමස්ත වශයෙන්, විදේශයන්හි ඇති මුදල් හා ශේෂ රුපියල් 33 කෝටි 10 ලක්ෂයකින් වැඩිවූ අතර, විදේශීය රාජ්‍යයන් හි සුරැකුම්පත් සහ විශේෂ හැරගැනුම් අයිතිවාසිකම් පිළිවෙළින් රුපියල් 2 කෝටි 60 ලක්ෂයකින් හා රුපියල් 2 කෝටි 80 ලක්ෂයකින් වැඩි විය. කෙසේ වුවද, මූලික වශයෙන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් මිලදී ගැනීම නිසා ජාත්‍යන්තර සංවිධාන වල වූ තැන්පතුවල හටගත් රුපියල් 7 කෝටි 30 ලක්ෂයක ඉහළ යාමද විදේශයන්ගෙන් ගත් ණය රුපියල් 70 ලක්ෂයකින් ඉහළ යාමද හේතුවෙන්' බැංකුවල විදේශ ගනුදෙනු නිසා ඇති වූ ප්‍රසාරණාත්මක බලපෑම රුපියල් 30 කෝටි 50 ලක්ෂයක් බවට පත්විය.

වෙළෙඳ බැංකුවල ශුද්ධ විදේශීය වත්කම්හි වූ වර්ධනය, දළ විදේශීය වත්කම් රුපියල් 17 කෝටි 60 ලක්ෂයකින් වැඩිවීමක සහ එම වැඩිවීම සුළු වශයෙන් කැපී යන ලෙස දළ විදේශීය වගකීම් රුපියල් 1 කෝටි 20 ලක්ෂයකින් වැඩිවීමක ප්‍රතිඵලයකි. මෙයින් මුල් කරුණ, එනම්; දළ විදේශීය වත්කම්වල වූ වැඩිවීම, වෙළෙඳ බැංකු වෙතැති විදේශීය මුදල්, විදේශ බැංකු වෙතැති මුදල් සහ අපනයන බිල්පත්, පිළිවෙළින් රුපියල් 30 ලක්ෂයකින්, රුපියල් 1 කෝටි 20 ලක්ෂයකින්, හා රුපියල් 16 කෝටි 30 ලක්ෂයකින්, වැඩිවීම නිසාත්, එම වැඩිවීම සුළු වශයෙන් කපා හරින ලෙස විදේශ බැංකුවලට දෙන ලද අයිරාවන් රුපියල් 10 ලක්ෂයකින් අඩුවීම නිසාත් සිදුවිය. ඉකුත් වසරෙහි දී මෙන්ම, දළ විදේශීය වගකීම්වල වූ වැඩිවීම බොහෝදුරට විදේශ බැංකු ආයතන වෙතින් ලබාගත් ණය වැඩිවීම නිසා සිදුවූවකි.

1975 වර්ෂය තුළදී, මුදල් සැපයුම කෙරෙහි ප්‍රසාරණාත්මක පීඩනයන් ඇති කිරීමෙහිලා රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතන ද ඇතුළු පෞද්ගලික අංශයෙහි බලපෑම, 1974 වර්ෂය හා සසඳ බලන කල ඉතා සුළු විය. 1976 වර්ෂයේදී, එම බලපෑම ඊටත් වඩා කුඩා විය. ඉහත කී රාජ්‍ය අංශයෙහි කටයුතු නිසා මුදල් සැපයුම කෙරෙහි වූ ශුද්ධ ප්‍රසාරණාත්මක බලපෑම, 1974

හා 1975 යන වර්ෂවලදී පිළිවෙළින් රුපියල් 53 කෝටි 30 ලක්ෂයක් හා රුපියල් 13 කෝටි 10 ලක්ෂයක් ලෙස පැවතිය ද, 1976 වර්ෂයේදී එම බලපෑම රුපියල් 7 කෝටියක් පමණක් විය.

පොළී අනුපාතික

1976 වර්ෂය තුළදී පොළී අනුපාතිකයන්හි වූ වෙනස්වීම ඉකුත් වර්ෂයෙහි තරම් කැපී නොපෙනුන ද, සිදුවූ වෙනස්වීම් මගින් පෙනී ගියේ, ඉහළ පොළී අනුපාතිකයන් කරා යොමු වීමකි. 1975 අප්‍රියෙල් මාසයේ දී හඳුන්වා දුන් මූල්‍ය ක්‍රියාමාර්ගයන් අනුව යමින් වෙළෙඳ බැංකුවල තැන්පතු පොළී අනුපාතිකයන්හි මූලික සංශෝධනයන් ඉකුත් වර්ෂයේදීම සිදු කරනු ලැබීය. තවද, පැවති පොළී අනුපාතිකයන් මත තැන්පතු රැස්කිරීමට වෙළෙඳ බැංකු මගින් දරන ලද උත්සාහය බොහෝදුරට සාර්ථක වූ නිසා 1976 වර්ෂය තුළදී, වෙළෙඳ බැංකුවලට තම තැන්පතු පොළී අනුපාතිකයන් ඉහළ නැංවෙන පරිදි සංශෝධනය කිරීමට තරම් බලවත් හේතුවක් නොවීය. ජාතික ඉතිරිකිරීමේ බැංකු තැන්පතු පොළී අනුපාතිකයන්, භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතිකයන්, සහ බැංකු පොළී අනුපාතිකයන් ද වර්ෂය තුළදී නොවෙනස්ව පැවතුනි. (කෙසේ වුවද, 1977 ජනවාරි 26 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකු පොළී අනුපාතිකය 2% කින් වැඩි කිරීමෙන් එය 8 1/2% දක්වා ඉහළ නංවන ලදී.)

1976 වර්ෂය තුළදී බැංකු අතර, ඒක්ෂණ ණය සඳහා වූ උපරිම හා අවම පොළී අනුපාතිකයන් ද පිළිවෙළින් සියයට 8 ක් සහ සියයට 5 ක් ලෙස නොවෙනස්ව පැවතුනි. කෙසේවුවද, වර්ෂයේ අවසානය වන විට සාමාන්‍ය පොළී අනුපාතිකය උපරිමය කරා නංවන බලපෑම් මෙකී වෙළෙඳපොලෙහි ඇති විය. මෙයට හේතුවූයේ, 1976 ඔක්තෝබර් 29 දින මුදල් නෝට්ටු හා කාසි ස්වරූපයෙන් වෙළෙඳ බැංකුවල තබාගත හැකිවූ සංචිත අනුපාතය ක්‍රමයෙන් අඩුකිරීමය. වර්ෂය ආරම්භයේදී වෙළෙඳ බිල්පත් සඳහා වූ වෙළෙඳ බැංකු වට්ටම් අනුපාතිකය ඉහළ යමින් එහි උපරිම මට්ටම සියයට 12 සිට 13 දක්වා පත්විණි. වෙළෙඳ බැංකු ණය දීමේදී අය කරනු ලබන පොළී අනුපාතිකයන් පිළිබඳ තොරතුරු ලබාගත හැකිව ඇත්තේ ඒ ඒ ණය ගැනුම්කරුවන් විසින් තබා ඇති ඇප පදනම් කර ගෙන පමණි. විවිධ ඇප යටතේ දෙන ලද ණය සහ අයිරාවන් සඳහා අයකරනු ලැබූ උපරිම පොළී අනුපාතිකයන් 1976 ජනවාරි මාසයේදී, එනම්; බැංකු තැන්පතුවල වැඩිවීමක් ආරම්භ වීමට පෙර ඉහළ නැඟුණි. රජයේ සුරැකුම්පත් ඇපයට තබා දෙන ලද ණය සහ අත්තිකාරම් සඳහා අය කරන ලද උපරිම පොළී අනුපාතිකයන් සියයට 11 සිට සියයට 14 දක්වා ද, බද්ධ ව්‍යාපාර සමාගම් වල කොටස් සඳහා සියයට 12 සිට සියයට 13 දක්වා ද, වෙළෙඳ තොග සඳහා සියයට 13 සිට සියයට 14 දක්වාද නිශ්චල දේපළ සඳහා සියයට 12 සිට 14 දක්වා ද, 'අනෙකුත්' ඇප සඳහා සියයට 13 සිට සියයට 14 දක්වා ද, මෙසේ වැඩිවීම් සිදු විය. මේ අනුව, උපරිම පොළී අනුපාතිකය වූ සියයට 14, 1975 වර්ෂය තුළදී ඇප රහිත අත්තිකාරම් සඳහා පමණක් බලපැවැත්වුවද, 1976 වර්ෂයේදී ඇප සහිත අත්තිකාරම් බොහොමයක් පිළිබඳවම එම සියයට 14 උපරිම පොළී අනුපාතිකය බලපැවැත්විණ.

වෙළෙඳ බැංකු කටයුතු

1976 වර්ෂය, වෙළෙඳ බැංකු සම්පත්වල තියුණු ප්‍රසාරණයක් හටගත් වර්ෂයක් විය. ඉකුත් වර්ෂයෙහි පැවති තත්ත්වය හා සසඳ බලන කල මුළු තැන්පතුවල වූ වර්ධනය, වාණිජ බැංකු සම්පත්වල සැලකිය යුතු වැඩිවීමකට ඉවහල් වූණි. වර්ෂය තුළදී, ඉල්ලුම් තැන්පතු රුපියල් 86 කෝටි 90 ලක්ෂයකින් වැඩිවූ අතර, කාලීන හා ඉතිරිකිරීම් තැන්පතු රුපියල් 46 කෝටි 30 ලක්ෂයකින් වැඩි විය. තැන්පතු වැඩිවීම නිසා සම්පත්වල වූ මෙම ඉහළ යාම, විදේශවලින් ගත් ණය වැඩිවීම, ගෙවා නිමි ප්‍රාග්ධනයන් වැඩිවීම, සංචිත අරමුදල් හා නොබෙදූ ලාභයන්හි වූ වැඩිවීම සහ අනෙකුත් වගකීම්වල වැඩිවීම යන කරුණු නිසා තවදුරටද සුළු වශයෙන් වැඩිවුනි. වර්ෂය තුළදී වෙළෙඳ බැංකු සම්පත් අඩු කිරීමෙහි ලා උපකාරී වූ එකම වෙනස්වීම වූයේ, මහ බැංකුව වෙතින් ලබාදුන් ණය පහසුකම්වල ඇතිවූ පහළ බැසීමයි. ඉකුත් වසරෙහිදී වූවාක් මෙන්ම, මුළු තැන්පතුවලට වූ ද්‍රවශීල වත්කම් හි

මාසික සාමාන්‍ය අනුපාතය, සියයට 32·6 සිට සියයට 29·6 දක්වා ද, මුළු තැන්පතු වලට වූ මුදල් ශේෂයන්හි මාසික සාමාන්‍ය අනුපාතය, සියයට 13·8 සිට සියයට 11·3 දක්වා ද පහළ වැටුනි. එහෙත් මෙම වෙනස්වීම්, වෙළෙඳ බැංකුවල ණය දීමේ ධාරිතාවේ ප්‍රමාණය ඉක්මවීමක් ලෙස වටහා ගත යුතු නොවේ. ඇත්තෙන්ම, මුළු තැන්පතුවලට ණය හා අත්තිකාරම්හි වූ සාමාන්‍ය අනුපාතය 1975 දී සියයට 97·5 සිට 1976 දී සියයට 91·0 දක්වා පහළ වැටින.

1976 වර්ෂය තුළදී පෞද්ගලික අංශයට (රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතනද ඇතුළත්ව) දෙන ලද වෙළෙඳ බැංකු ණය රුපියල් 73 කෝටියකින් හෙවත් සියයට 19·6 කින් වැඩිවිය. 1975 වර්ෂයේදී මෙම ණයවල වූ රුපියල් 18 කෝටි 10 ලක්ෂයක හෙවත් සියයට 5·1 ක වැඩිවීම හා සසඳන කල මෙය දැඩි වෙනස්වීමකි. 1976 වර්ෂය තුළදී වෙළෙඳ බැංකු ණයවල වැඩිවීම මූලික වශයෙන් ණය සැපයීම් ස්වරූපයෙන් වූ රුපියල් 53 කෝටි 90 ලක්ෂයක වැඩිවීම මගින් පෙනී ගියේය. එමෙන්ම, අපනයන බිල්පත් රුපියල් 16 කෝටි 30 ලක්ෂයකින්ද, අයිරාවන් රුපියල් 7 කෝටි 20 ලක්ෂයකින්ද, එකතු වෙමින් පැවති මුදල් ශීර්ෂ රුපියල් 6 කෝටි 70 ලක්ෂයකින්ද, වැඩි විය. අනෙක් අතට, වර්ෂය තුළදී වෙළෙඳ බැංකු වෙතැති ආනයන බිල්පත් රුපියල් 11 කෝටි 10 ලක්ෂයකින් අඩු විය. පෞද්ගලික අංශයට ඇතුළත් සෑම උප කොටසකටම දෙන ලද බැංකු ණයවල වැඩිවීමක් පෙන්නුම් කළද, විශාලතම වැඩිවීම වූ රුපියල් 57 කෝටි 50 ලක්ෂය පෞද්ගලික අංශයේ සෙසු ගනුදෙනුකරුවන්ට දුන් ණය හා සම්බන්ධයෙන් වුනි. සමුපකාර ආයතනයන්ට දෙන ලද බැංකු ණය රුපියල් 11 කෝටි 30 ලක්ෂයකින් වැඩිවූ අතර, රාජ්‍ය සංස්ථාවලට දුන් ණය රුපියල් 4 කෝටි 30 ලක්ෂයකින් වැඩි විය. පෞද්ගලික අංශයේ සෙසු ගනුදෙනුකරුවන් සඳහා දෙන ලද බැංකු ණයවල ඉහතකී තියුණු වැඩිවීම බැංකු ක්‍රමය සතු වූ, පෞද්ගලික අංශයෙහි කාලීන හා ඉතිරිකිරීම් තැන්පතුවල සැලකිය යුතු ඉහළ යාමක් පසුබිම් කොටගෙන සිදුවූ බව කිව යුතුය. මුළු වශයෙන් මෙම තැන්පතු රුපියල් 48 කෝටි 70 ලක්ෂයකින් වැඩිවීම නිසා ණයදීම්වල වූ ශුද්ධ වැඩිවීම රුපියල් 8 කෝටි 80 ලක්ෂයක් විය. ඉකුත් වසරේදී මෙන්ම, 1976 වර්ෂය තුළදී වූ බැංකු ණයදීම් වැඩිවීමට සම්පූර්ණයෙන්ම වාගේ වගකිව යුත්තේ දේශීය බැංකු ය. මුළු වැඩිවීමෙන් රුපියල් 72 කෝටි 40 ලක්ෂයක් හෙවත්, සියයට 99·2 ක්ම දේශීය බැංකු නිසා හටගති.

වෙළෙඳ බැංකු ශාඛා ව්‍යාප්තිය

මෑත වර්ෂයන්හි දී වෙළෙඳ බැංකු ශාඛා ව්‍යාප්තියෙහි පැවති සීඝ්‍ර දියුණුව 1976 වර්ෂය තුළදී ද පැවති අතර, වර්ෂය තුළදී විවෘත කළ මුළු ශාඛා කාර්යාල ගණන 77 ක් විය. මෙම වැඩිවීම මුළුමනින්ම දේශීය බැංකුවලට පමණක් සීමා වූ අතර, විදේශ බැංකු මගින් පවත්වාගෙන ආ බැංකු කාර්යාල සංඛ්‍යාවෙහි වෙනසක් සිදු නොවීය. වර්ෂය තුළදී විවෘත කළ මුළු බැංකු කාර්යාල ගණන, 1975 දී (105), හා 1974 දී (154), විවෘත කළ සංඛ්‍යාවට වඩා තරමක් අඩු වුවද, එමගින් දේශීය වෙළෙඳ බැංකු කාර්යාල විකාශනය වීමේ අනුපාතයෙහි පිරිහීමක් අදහස් නොකෙරේ. වර්ෂය තුළදී විවෘත කළ මුළු ශාඛා කාර්යාල 77 න්, ලංකා බැංකුව විසින් විවෘත කළ කෘෂි සේවා ශාඛා මධ්‍යස්ථාන ගණන 42 ක් පමණක් වීම නිසා, ශාඛා කාර්යාල වලින් 35 තරම් වූ සංඛ්‍යාවක් පූර්ණ බැංකු ශාඛා කාර්යාලයන් වූ බව පෙනේ. එහෙත් ඉකුත් වසරේදී විවෘත කළ ශාඛා කාර්යාල 105 න් පූර්ණ බැංකු ශාඛා කාර්යාල වූයේ 8 ක් පමණි. 1976 වර්ෂය අවසාන වන විට මුළු කෘෂි සේවා ශාඛා මධ්‍යස්ථාන 341 ක් විය. මීට අමතරව, 1976 අවසාන වන විට ලංකා බැංකුව තම පූර්ණ ශාඛා කාර්යාල ගණන 70 දක්වා නංවමින් පූර්ණ ශාඛා කාර්යාල දෙකක් විවෘත කළ අතර, කච්චේරි බැංකු ශාඛා 3 ක් පූර්ණ ශාඛා කාර්යාල බවට පත් කරන ලදී.

1976 වර්ෂය තුළදී වෙළෙඳ බැංකු ශාඛා විකාශනයෙහි ලා කැපී පෙනෙන ලක්ෂණයක් වූයේ, මහජන බැංකුව විසින් අනුගමනය කළ දැඩි ව්‍යාප්තික වැඩසටහන ය. සමස්ත වශයෙන්, මහජන බැංකුව 1976 වර්ෂය අවසාන වන විට සිය ශාඛා කාර්යාල ගණන 187

දක්වා වැඩි කරමින්, වර්ෂය තුළදී නව ශාඛා කාර්යාල 29 ක් විවෘත කළාය. එහෙත් ඉකුත් වසර තුළදී මහජන බැංකුව විසින් විවෘත කරන ලද නව ශාඛා කාර්යාල ගණන 5 ක් පමණක් විය. වර්ෂය තුළදී මහජන බැංකුව විසින් විවෘත කළ මෙම ශාඛාවන් දිවයින පුරා පුළුල් ලෙස පැතිර පැවතුනි. 1976 වර්ෂය අවසාන වන විට තම ශාඛා ගණන 23 දක්වා වැඩි කරමින්, හැටන් නැෂනල් බැංකුව විසින් ද එක් ශාඛාවක් විවෘත කරන ලදී..

ග්‍රාමීය ණය

1976 වර්ෂය තුළදී අංග සම්පූර්ණ ග්‍රාමීය ණය ක්‍රමය සහ ග්‍රාමීය බැංකු ක්‍රමය යටතේ හා ලංකා බැංකු උප ශාඛා කාර්යාල මගින් බෙදහරින ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 16 කෝටි 19 ලක්ෂයක් විය. මෙය, ඉකුත් වර්ෂයේ දී ඊට අනුරූපව බෙද දෙන ලද ප්‍රමාණයට වඩා සියයට 25·6 ක වැඩිවීමකි. මෙම මුළු ණය ප්‍රමාණයෙන් සියයට 49·4 ක් අංග සම්පූර්ණ ග්‍රාමීය ණය ක්‍රමය යටතේ ග්‍රාමීය බැංකු සහ විවිධ සේවා සමුපකාර සමිති මගින් බෙදහරිනු ලැබීය.

අරමුණු වශයෙන් ගත් කල, මෙම යෝජනා ක්‍රම තුන යටතේ වූ මුළු ණයදීම් ප්‍රමාණයෙන් රුපියල් 13 කෝටි 8 ලක්ෂයක් හෙවත් සියයට 80·8 ක් භෝග වගා කිරීම සඳහා දෙන ලද ණය වූ අතර, එය ඉකුත් වසරෙහි වූ ප්‍රමාණයට වඩා රුපියල් 2 කෝටි 48 ලක්ෂයක වැඩිවීමක් පෙන්නුම් කළේය. වී වගාව සඳහා දෙන ලද ණය ප්‍රමාණය මුළු වගා ණය වලින් සියයට 72.3 ක් හෙවත් ඉහත කී යෝජනා ක්‍රම තුන යටතේ සැම අරමුණක් සඳහාම දෙන ලද මුළු ණය වලින් සියයට 58·4 ක් විය. වී වගාව සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් විශාල කොටසක් එනම්, රුපියල් 6 කෝටි 91 ලක්ෂයක් ඉකුත් වසරේදී මෙන්ම අංග සම්පූර්ණ ග්‍රාමීය ණය ක්‍රමය යටතේ මහජන බැංකුව විසින් ග්‍රාමීය බැංකු සහ විවිධ සේවා සමුපකාර සමිති මාර්ගයෙන් බෙදහරින ලදී. වර්ෂය තුළදී අතිරේක ආහාර භෝග වගාව සඳහා දෙන ලද ණය ප්‍රමාණය රුපියල් 3 කෝටි 22 ලක්ෂයක් විය. මෙම ප්‍රමාණය මුළු වගා ණය වලින් සියයට 24·6 ක් වූ අතර යෝජනා ක්‍රම තුන යටතේ සැම අරමුණක් සඳහාම දෙන ලද මුළු ණය ප්‍රමාණයෙන් සියයට 19·9 ක් විය. ග්‍රාමීය බැංකු වලින් සහ කෘෂි සේවා මධ්‍යස්ථානවල ඇති ලංකා බැංකු උප ශාඛා කාර්යාල මගින් නිවාස තැනීම, විදුලිය සැපයීම සහ ළිං කැණීම සඳහා දෙන ලද ණය ප්‍රමාණය රුපියල් 1 කෝටි 37 ලක්ෂයක් විය.

1967 නව කෘෂිකාර්මික ණය ක්‍රමය ආරම්භ කළ තැන් පටන් ඒ ක්‍රමය යටතේ හා ඊට අනතුරුව හඳුන්වා දුන් අංග සම්පූර්ණ ග්‍රාමීය ණය ක්‍රමය යටතේ 1975/76 මහ කන්නය තෙක් මහජන බැංකුව විසින් දෙන ලද මුළු වී වගා ණය ප්‍රමාණය රුපියල් 49 කෝටි 89 ලක්ෂයක් විය. 1976 වර්ෂය අවසානයේදී වාර්තා කර ඇති පරිදි, එම මුළු ණය ප්‍රමාණයෙන් රුපියල් 20 කෝටි 41 ලක්ෂයක් හෙවත් වී වගා ණය වලින් සියයට 40·9 ක් පැහැර හරින ලද ණය විය. 1976 අවසාන වන විට වගා ණය ක්‍රමය යටතේ සියළුම වගාවන් සඳහා දෙන ලද මුළු ණය ප්‍රමාණය රුපියල් 65 කෝටි 32 ලක්ෂයක් විය.

ණය පැහැර හැරීමේ අනුපාතය ඉහළ යාම වගා ණය සම්බන්ධයෙන් නොකඩවාම දක්නට ලැබුන ප්‍රධාන ප්‍රශ්නයකි. මෑත වර්ෂවලදී ගොවියන්ට මෙසේ තම ණය ආපසු ගෙවිය හැකි ශක්තියේ අඩුවීමකට බලපෑ මූලික සාධකයක් වූයේ අයහපත් කාලගුණයයි. එහෙත් ණය ආපසු ගෙවීම් ප්‍රමාණය නොකඩවාම අඩුවීමට වගකිව යුත්තේ මෙම සාධකය පමණක්ම නොවේ. එහෙයින් ණය ආපසු ලබාගැනීමේ අනුපාතය වැඩි කර ගැනීමෙහිලා වගා ණය පාලන ක්‍රමයෙහි ආයතනික කරුණු පරීක්ෂණයකට භාජනය විය යුතු අතර, ඒවායේ දියුණුවක් ඇති කිරීමද අවශ්‍ය වේ.

මූල්‍ය ප්‍රතිපත්ති

1976 දී තියුණු මුල්‍ය ප්‍රසාරණයක් පවතින පසුබිමක, වෙළෙඳ බැංකුවලින් දෙන ලද ණය මැඩපැවැත්වීමට ඉවහල් වන පරිදි ඇතැම් මූල්‍ය ප්‍රතිපත්තීන් හඳුන්වා දීම වර්ෂය තුළදී සිදුවිය **පළමුව,** 1976 ඔක්තෝබර් 29 වැනි දින සිට වෙළෙඳ බැංකුවලට කැට මුදල් ලෙස තබා

ගැනීමට අවසර දෙන ලද සංචිත ප්‍රමාණය ක්‍රමයෙන් අඩුකරන ලදී. දෙවනුව, 1976 ඔක්තෝබර් මස 4 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්‍යවශ්‍ය නොවන අරමුණුවලට දෙන ලද ණය සඳහා සීමාවක් පනවන ලදී. මේ හැර බැංකු පොළී අනුපාතිකයන් ඉහළ නැංවීම සඳහා වූ සංශෝධනයන් ගැන සලකා බැලුණද, එය 1977 ජනවාරි මස 26 වැනි දින දක්වා කල් දමන ලද අතර, එදින සිට බැංකු පොළී අනුපාතිකය සියයට 2 කින් වැඩිකිරීමෙන් එය සියයට 8 1/2 දක්වා ඉහළ නංවන ලදී.

1976 දී දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක් ක්‍රියාවේ යෙදවීමට තීරණය නොවූයේ, වර්ෂය තුළදී වූ මූල්‍ය ප්‍රසාරණය පෞද්ගලික අංශයට අනවශ්‍ය ලෙස බැංකු ණය ප්‍රසාරණයකින් සිදුවූවක් නුවූ බැවිනි. මෙබඳු අවස්ථාවලදී වඩාත් අර්ථාන්විත වන්නේ අත්‍යවශ්‍ය නොවන අරමුණු සඳහා දෙන ලද බැංකු ණයවල වර්ධනය සලකා බැලෙන අයුරින් ඒ අංශයට සීමිත වූ මූල්‍ය ප්‍රතිපත්තීන් යොදා ගැනීමය. 1976 වර්ෂය තුළදී වූ මූල්‍ය ප්‍රසාරණයට මූලික වශයෙන්ම හේතුවූයේ, රජයේ මූල්‍ය කටයුතු සහ විදේශීය බැංකු වත්කම්හි වර්ධනයන් ය. එබඳු ප්‍රසාරණාත්මක බලපෑමක් මැඩපැවැත්වීමෙලා හුදෙක් මූල්‍ය ප්‍රතිපත්තීන්හි යෝග්‍යතාවය සීමිතය. 1976 වර්ෂය තුළදී රාජ්‍ය සංස්ථා හා සමුපකාර ආයතනද ඇතුළත්ව පෞද්ගලික අංශයට දෙන ලද ශුද්ධ ණය ප්‍රමාණය වැඩිවූයේ රුපියල් 7 කෝටියකින් පමණි. මෙසේ පෞද්ගලික අංශයට අයෝග්‍ය ලෙස වූ ණය ප්‍රසාරණයක් රහිතව හටගත් මූල්‍ය ප්‍රසාරණාත්මක අවස්ථාවකදී, මිල ඉහළ යාම වැලැක්වීම සඳහා දැඩි මූල්‍ය ප්‍රතිපත්තියක කාර්යක්ෂමතාව ඉතා සීමිත වේ. 1976 වර්ෂය තුළදී ඉතා තියුණු මූල්‍ය ප්‍රසාරණයක් මධ්‍යයේ ගන්නා ලද ලිහිල් මූල්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සලකා බැලිය යුත්තේ එම පසුබිම තුළ පිහිටාය.